දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක: 01/2002

මගේ අංකය : ඒ09/චක්‍රලේඛ,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
340, ආර්.ඒ.ද මැල් මාවත,
කොළඹ 03.
2002.01 .16.... දින.

සියලුම අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන්/
දිස්ත්‍රික් ලේකම්වරුන්, කලාප භාර සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන්,
දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන්, ඉඩම් සහ අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන්.

## උප්පැන්න සහතික ඉල්ලුම් කිරීමේ ආකෘතිපත්‍ර වෙනුවට මරණ සහතික ඉල්ලුම් කිරීමේ ආකෘතිපත්‍ර නිකුත් කිරීම වැළැක්වීම

උප්පැන්න සහතික ඉල්ලුම් කිරීමේ ආකෘති පත්‍ර ඉල්ලා සිටින විට, මරණ සහතික ඉල්ලුම් කිරීමේ ආකෘති පත්‍ර නිකුත් කරන බවත්, මරණ සහතික ඉල්ලුම් කිරීමේ ආකෘති පත්‍රයේ 'මරණයක්' යනුවෙන් සඳහන් ස්ථානය 'උප්පැන්නයක්' යනුවෙන් වෙනස් කර ඒවා මහජනයාට නිකුත් කරන බවත්, පසුගිය දිනවල පුවත්පත් මාර්ගයෙන් ප්‍රසිද්ධියට පත්කර ඇත.

02. මේ හේතුවෙන් දෙපාර්තමේන්තුවේ රාජකාරි කටයුතු පිළිබඳව මහජන අප්‍රසාදය පළවන බැවින්, එම තත්වය වලක්වා ගැනීම සඳහා මින් ඉදිරියට උප්පැන්න සහතික ඉල්ලුම් කිරීමේ ආකෘති පත්‍ර වෙනුවට මරණ සහතික ඉල්ලුම් කිරීමේ ආකෘතිපත්‍ර මහජනයාට නිකුත් නොකරන ලෙස, මෙයින් කාරුණිකව දන්වමි.

03. උප්පැන්න සහතික ඉල්ලුම් කිරීමේ ආකෘතිපත්‍ර අවසන් වූ විට, අවශ්‍ය ආකෘතිපත්‍ර ප්‍රධාන කාර්යාලයේ සැපයුම් (ගබඩා) අංශයට නොපමාව දන්වා, ඒවා ලබා ගැනීමට කටයුතු කරන්න.

04. එමෙන්ම, උප්පැන්න සහතික ඉල්ලුම් කිරීමේ ආකෘති පත්‍රවල හිඟයක් ඇත්නම්, එම ආකෘති පත්‍රයේ ආදර්ශයක්, කාර්යාලය තුළ මහජන ප්‍රදර්ශනය සඳහා තබා, ඒ අනුව සකස් කරගත් ආකෘතියක උප්පැන්න සහතික ඉල්ලුම් කිරීමට හැකිවන පරිදි කටයුතු කරන ලෙසත්, මෙයින් කාරුණිකව දන්වමි.

එල්.කේ. රත්නසිරි,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

පිටපත් :-
1. ප්‍රධාන කාර්යාලයේ සියලුම මාණ්ඩලික නිලධාරීන්,
2. ශාඛා ප්‍රධානී - විවාහ, උප්පැන්න හා මරණ අංශය
3. ශාඛා ප්‍රධානී - සැපයුම් අංශය

එච්/-